


# බුදු බණ විකුණාගෙන කන්නෝ

"මුතු" ලස්සන නමකි. ඒ නමින් මෑතක මෙල්බර්න් නගරයේ ප්‍රකාශයට පත් පුවත්පත ද නමට ඔබින ඔපයකින් යුතු බව කියමි. තිරයෙන් පිටුපස සිට මෙහෙයවුවත් එහි සංස්කාරකයෝ කෝඩුකාරයෝ නොවෙති. හොඳ වැඩ කාරයෝ ය.

අලුත් මුතු කලාපය මා අතට පත් වූයේ මගේ දෙසැම්බර් කස්තිරම ලියා තැපැල් කළාට පස්සේ ය. එක අතකින් ඒ නිසා මට තවත් ලිපියකට



මාතෘකාවක් ලැබුණේ ය. නැත්නම් ඒ කතාවත් මා ලියූ දැවමොට්ටාවේ හාමුදුරුවන් පිළිබඳ විස්තරයට එකතු කරලා නිකම් ඉන්නවා ය.

එහෙම නොවෙච්ච එක කොයි තරම් හොඳද? මුතු සංස්කාරකයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද සුවිශේෂ ප්‍රවෘත්තිය දැවමොට්ටාවේ හෝ මීටියාගෙඩ මට්ටමේ පුහුදුන් වැඩ කටයුතු හෝ රාජකාරි ගැන කියන්නක් නොවේ. ලෝකෝත්තර තලයකට ආරූඪ වූ උත්තරීතර නොහොත් අතිපූජ්‍ය යයි බොහෝ විට කියන පැළැන්තියට අවතීර්ණ වූ පුද්ගලයකු ගේ වික්‍රමය ගැන කරන විස්තර විවරණයකි.

ඒ පුද්ගලයා ගැන කියන අතරම රුවන්වැල්ල පැත්තේ සාස්තරකාරයකු ගැනත් සඳහන් කිරීම අර උත්තමයාට කරන මදි කමක් බව සංස්කාකයෝ නොසිතුවෝ ද? එහෙම නැත්නම් දෙන්නාම දෙවිදියක සූරයන් බව නිගමනය කොට එක ම ඉත්තේ දෙකොණක රඳවා ප්‍රදර්ශනය කළාහු ද?

දෙදෙනා අතර සිවුරු ඇරුණු විට සමානකමක් ඇති බව පෙනෙයි. වාර්තාවන ආකාරයට දෙන්නාම උපාධිධාරීහු ය. ආචාර්ය උපාධිධාරීන් ශ්‍රී ලංකාවේ වැහි වැහැලා ඉන්නකොට ඒකත් අරුමයක් ද?

යන්තර මන්තර දන්නා කියන පැවිද්දන් ගැරහීම ලොකු අපලයක පෙර නිමිත්තක් ද විය හැකි ය. ජනප්‍රවාදයේ එන විදියට නම් මහා දානපති චාර්ල්ස් ද සොයිසා කොලු ගැටයකු හැටියට බත්තරමුල්ලේ ශ්‍රී සුභූති ස්වාමීන් වහන්සේ ළඟ සිටියෙක්ලු. කොල්ලාගේ කේන්දරය බැලූ හාමුදුරුවෝ ඔහුගේ අනාගත සෞභාග්‍යය දැක "උඹට මෙහේ ඉඳන් වැඩක් වෙන්නේ නැහැ. මෙන්න මේකත් අරන් ගිහින් මොකක් හරි කරුමාන්තයක් පටන් ගනින්" කියා සුළු මුදලක් අතට දී පිටත් කළ බව කියැවෙයි.

චාර්ල්ස් ද සොයිසා අද ඇස්වාට්ටුව වට රවුමේ කිසිවකු ගණනකට නොගන්නා ආකාරයට කුලුනක් උඩ සිට ගෙන හිටියත් එතැන ඇස් වාට්ටුව තව ඈතින් සොයිසා වාට්ටුව පමණක් නොව මොරටුවේ වේල්ස් කුමාර විදුහල ආදී ආයතන පොදු ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් ජාතියට දායාද කර දුන් බව මතක් කළ යුතු ය.

චාර්ල්ස් ද සොයියා මිය ගියේ වත්මන් කුමාරතුංග

අනෙක් පුද්ගලයා එනම් සුපකට ධර්ම කථික පිටිදූවේ සිරිධම්ම හාමුදුරුවෝ ද දැවමොට්ටාවේ මීටියාගොඩ ගණයට නොදැමිය හැකි අති විශේෂ භික්ෂුවකි. මුතු සඟරාව කියන විදියට දැන් බොහෝ දෙනා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නා වූත් සමහරු සහතික පත්‍ර ප්‍රදානය මගින් තහවුරු කරන්නාවූත් සෝවාන් තත්වයට පිවිසීමට වඩා ඉහළ තැනකට ආරූඪ වී සිටිනවාය, එනම් සෝවාන් පිම්ම පැනලා ඊළඟ පිම්මත් පැනපු කෙනකු බව උන්වහන්සේම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන බව ය.

යථා කාලයේ දී සෝවාන්කාරයන්ගේ තත්ව නිරාකරණයට පවත්වන විදියේ ම සුදුසුකම් තීරණය කිරීමේ ක්‍රමවේදයක් ගුණ මනින සමාගමක් හෝ වෙනත් සංවිධානයක් හඳුන්වා දෙන එක ගැන නම් සැකයක් නැත .

එහෙම කරන්නට හේතු සාධක ඇත . දැන් දැන් බැලූ කොට ලොව්තුරා සැප සම්පත් හෝ ගුණ මහිම පවා මුදල් හදල් නැතිව අත්පත් කර ගැනීම උගහට ය.

ශ්‍රී සම්බුද්ධ ජයන්තියක් ගැන හිතන්නටත් ඉස්පාසුවක් නොතිබුණු දැනට අඩ සියවසකටත් ඉස්සර අපේ කාලේ සරසවි ගැටයන් පමණක් නොව සකලවිධ තරුණ පරපුරම මහා උජාරුවකින් ජන විඥානයට හුරු කළ අසංවර ගීතයක් වූ "බල්ලො මරා හරි සල්ලි හොයා ගැනීමේ" කලාව නොහොත් ක්‍රමවේදය නොහොත් මගඩිය මේ සුපිරිසිදු සම්බුද්ධ ජයන්ති වර්ෂය තුළත් හිස් මුදුනින් පිළිගන්නා බෞද්ධයන් ධර්ම ද්වීපයේ සිටීමද පුදුමයට කරුණක් නොවිය යුතු ය.

මට සිහිපත් කළ හැකි හොඳම නිදසුන ඉදිරිපත් වූයේ කොට්ටාව නොහොත් පන්නිපිටිය පෙදෙසේ කලකට උඩ දී ආරාමයක් පවත්වාගෙන ගිය රහත් මෑණියන්ගෙනි. මෑණියන් යයි මා කීවාට මේ කියන කාන්තාව සිවුරු දරා සිටි බව පිළිගත යුතු ය. සිවුරු තබා වැරහැලි දරා ගෙන සිටියත් රහත් වූවාට පස්සේ ඒ සියල්ල අතහැර ඇය යන නිවන් මග පවා සිල් සුවඳින් පිරී ඉතිරී යන්නටත් ඇත .

මෙහෙම අඩමානයට ලියන්නට සිද්ද වන්නේ ඒ ගමනේ පොඩි පරහක් තිබිච්ච හින්දා ය. බුදු බණ හා නිවන් මග පිළිබඳ පොත් ගණනාවක් ලියූ උපාධිධාරී ගුරුවරියක හා විදුහල්පතිවරියක ව සිටි ඒ කාන්තාව

මාවත රීඩ් මාවතට වැටෙන්නට කලින් රැපින විදිය පසු කළ විට දකුණු පැත්තේ ඇති දෙමහල් මන්දිරය තුළ බව කියනු ලැබේ. කොහේදෝ ඉඳන් උඩු මහලටම කඩා වැටුණු පිස්සු බල්ලකු විසින් සපා කනු ලැබීමෙන් පසුව ය එසේ මිය ගියේ.

පිස්සු බල්ලා එවූයේ අර මුත්තරබල්ලා ය. දියුණුවේ හිණි පෙත්තටම නැග සිටි තමාගේ පරණ ගෝලයාට පණිවිඩයක් යැවූ බත්තරමුල්ලේ සුභූති හාමුදුරුවෝ තමා මුණ ගැසෙන්නැයි ඔහුට කියා යැව්වෝ ය. සොයිසා එය ගසා බසා දැම්මේ "මට ඔය මුත්තර බල්ලෝ වැඩක් නැහැ" යි කියලා ය. එය සැල වූ විට නයා මෙන් කිපුණු සුභූති හාමුදුරුවෝ "හොඳයි මම ඕකට මුත්තරබල්ලෙක් පෙන්නන්නම්" යයි පවසා පිස්සු බල්ලා නොහොත් බලු වෙස් ගත් පිල්ලිය පිටත් කර යැවූහ.

අර කියාපු සාස්තරකාරයාට මූදෙන් එතෙර තියා රුවන්වැල්ල පෙදෙසේ වුවත් පිල්ලියක් ඇර ගන්නට බැරි බව ඔහුට සමච්චල් කරන අය දන්නවා ඇතැයි සිතමි.

යටතේ රහත් බව ලබනු වස් පුරුදු පුහුණු වූ තවත් එබඳුම උපාධිධාරී කාන්තාවක් රහත් අඩවිය පෙනෙන මානයට ළං ව සිටියාලු. ඒ බව අවබෝධකරගත් රහත් මෑණියෝ තම ගෝලයාගේ සසර බර හෑල්ලු කර දීමට කල්පනා කළාහ. සැළකිය යුතු ඉඩකඩම් ප්‍රමාණයක් හා ධනයක් හිමිව සිටි ගෝලයාට ඔය ටිකත් පොදි ගහගෙන යනවාට වඩා හිස් අතින්ම යන එක කොච්චර පහසුවක් දැයි හේතු සාධක දක්වා ඒත්තු ගන්වා ඇය සතු සබ්බසකලමනාව ම තමාගේ නමට ලියවා ගත් බව ද වාර්තා වී ඇත . ගෝලයාට තබා රහත් වූ බව කියන අම්මණ්ඩිටත් ලැබිච්ච නිවනක් නැත . ඉඩකඩම් හා ධනය අහිමි වූ කාන්තාවක් මහ පොළොවට අවතීර්ණව ලෞකික සම්පත් වෙනුවෙන් නඩු මගට පිවිසි බවත් වාර්තා විය. අර කියපු රහත් මැනියන් නොහොත් කට්ට කයිරාටික හෙර නීතියේ රැහැනට හසුවූවාද යන්න නොදනිමි.

පාරම්පරික බෞද්ධයකු හැටියට සඟුන්ට ගරු සරු දැක්වුවත් මම සිවුරු පොරවාගත් හොරුන්ට ගරු කරන්නට තරම් නිවට නොවෙමි. ඔය මුතු සංස්කාරකයන් විස්තර කරන විද්‍යා උපාධිධාරී භික්ෂුව ගැන පුවතක් මට දැනගන්නට ලැබුණේ වසර හයකට පමණ පෙර ගම රට බලා ගිය විට ය. පුවත කීවේ පන්නිපිටියේ වසන මගේ ඥාති පුත්‍රයෙකි.

ඔහු යන පන්සලක ධර්මදේශනයක් සඳහා අර හාමුදුරුවන්ට - පිටිදූවේ සිරිධම්ම හිමියන්ට - ආරාධනාවක් කරන ලදී . හාමුදුරුවන්ගේ කැරැට්ටුව දන්නා පන්සලේ ලොකු හාමුදුරුවෝ සල්ලි දීලා නම් බණට ගෙන්වන්න එපා යයි අනතුරු ඇඟවූහ. එහෙත් සැදැහැවත් දායකයන් ඒ තහංචිය කඩා ඒ වන විටත් අත්තිකාරම් මුදල් ගෙවා තිබුණෝය. රුපියල් පන්දාහක් මගේ ඥාතියා කියන විදියට ඉතිරි මුදල බණ කියා නිමවූ පසු ය. ඒ කිසිවක් ධර්මදේශකයන්ගේ අතට දෙන්නේ නැත . ඒවා දෙන හා බාරගන්නා ක්‍රමවේද සකස්කොට තිබුණා ලු. කොටින්ම බණට ආරාධනාකරන්නා පවා මුණගැසෙන්නේ අර තැරැව්කාරයා ය. දේශකයා සමග වචනයක් කතා කරන්නේද නැත.

ආඳා මාලු ඉරටෙන් කන කතාව මතක් කරන ධර්ම ක්‍රමවේදයක් ද?

මුතු පුවත අනුව දැන් මුදලින් පමණක් නොව පුද්ගලයා වශයෙනුත් මොහුගේ ලන්සුව අහස උසට - නැත. අකනිටාව දක්වා - ඉහළ ගිහිල්ලා ය.

හාමුදුරුවෝ නිවන් පාරේ පළමු කඩුල්ල පැනලා දෙවැනි කඩුල්ලත් අතික්‍රමණය කරනු පාටයි. වෙනත් විදියකට කියනවා නම් සකෘදාගාමී භාවයට පත්වෙලාලු. එහෙම තත්වයක් උන්වහන්සේට නැතෙයි කියා ඔප්පු කරන කෙනෙකුගේ කල්ල මරේ. සල්ලිවලින් ලක්ෂ පන්සියයක් දෙන්න සූදානම්ලු.

මට කුරුණෑගල කතන්දරයක් මතක් වෙයි. මගේ මිතුරා කුරුණෑගල උපන්නෙකි. ඔහුට ගමට ගිය වෙලාවක මහව පළාතේ රහත් ඵලයට පත් වූ ගැහැනියක ගැන පුවතක් දැනගන්නට ලැබුණේ ය. මේ අරුම පුදුම ලලනාව දැකගන්නට හිත හිතා සිටි ඔහුට හදිසියේ මුණ ගැසුණේ මහව පෙදෙසේ සේවය කරන මනෝ චිකිත්සකයෙකි. තමාගේ අදහස කී විට වෛද්‍යවරයා ඒ ගමන අවශ්‍ය නැති බව පෙන්වා දුන්නේ ය.

"ඇය මගෙන් බෙහෙත් ගත්තා. දැන් ඇයට සනීපයි."

ඒ කියන්නේ රහත් බව ඔළුවෙන් ඉවත් වෙලා මහ පොළොවට පාත් වෙලා ඉන්නවා කියන එක ය. මේ කියන සකෘදාගාමීකාරයාටත් ඒ වාගේ ප්‍රතිකාර කළ හැකි වෙද්දු ශ්‍රී ලංකාවේ නැද්ද?

ඊටත් වඩා බරපතල ප්‍රශ්න ගණනාවක් මේ සමග ම ඉස්මතුවෙයි.

ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසන අමාත්‍යාංශයක් තියෙනවා නේද? එයින් කෙරෙන්නේ මොකක්ද? නිර්මල බෞද්ධ ධර්මය රැකගන්නට ත්‍රෛනිකායික මහ සංඝයා වැඩ සිටිනවා නේද? සමස්ත ලෝකයේම විවිධ මහාද්වීප සඳහා සංඝනායකයන් පත් කරන ඒ මහා සංඝයා මේ විජ්ජාකාරයන් මෙල්ලකරන්නට නැතිනම් ඔවුන්ගේ හෙළුව හෙළිකරන්නට සමත් නොවන්නේ ද?
සම්බුද්ධ වර්ශයේ මේ විකටයන්ට බුදුදහම විකුණාගෙන කන්න ඉඩ දෙන්නේ ඇයි? ■

